සියලුම හිමිකම් ඇවිරිණී/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

06 ශ්‍රේණිය	තෙවන වාර පරීක්ෂණය - 2024	50	S	I,II

නම: ..... නාට්‍ය හා රංගකලාව කාලය පැය දෙකයි

★ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
★ ප්‍රශ්න අංක 01 සිට 06 දක්වා ප්‍රශ්න වලට ගැළපෙන වඩාත් නිවැරදි පිළිතුර යටින් ඉරක් අදින්න.

01) ජන කතාවක දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,
1. සරල බව. 2. සංකීර්ණ බව. 3. නීරස බව 4. රචකයෙකු සිටීම.

02) ජන කතාවක් ඉදිරිපත් කරන්නා විසින් සැළකිය යුතු කරුණක් වන්නේ,
1. අසන්නාට පැහැදිලි වීම. 2. සබකෝලයෙන් යුක්ත වීම.
3. හඬ පාලනයෙන් තොරවීම. 4. විරාම නොතැබීම.

03) කිසියම් චරිතයක්, සිද්ධියක් හෝ භූමිකාවක් ඒ ආකාරයෙන්ම සිදු කිරීම. මේ නමින් හැඳින්වේ.
1. සමාරෝපය. 2. අනුරූපණය. 3. අනුකරණය. 4. අභිරූපණය.

04) වාචික අභිනය ගෙන හැර දැක්විය හැකි වනුයේ පහත සඳහන් කුමන අංගයක් මගින් ද?
1. අත්පා මගින් ය. 2. මුහුණේ ඉරියව් මගින් ය. 3. වේදිකා පසුතල මගින් ය. 4. ගීත මගින් ය.

05) ප්‍රාසාංගික කලාවන් අතර සුවිශේෂී වූ කලාව වන්නේ,
1. නර්තන කලාව 2. ගීත කලාව 3. නාට්‍ය කලාව 4. බැලේ කලාව

06) ප්‍රේක්ෂකයා නාට්‍ය නිර්මාණයක් රස විඳිනුයේ මින් කුමන ආකාරයකින් ද?
1. කියවීම මගින් 2. ඇසීම මගින් 3. රඟපෑම මගින් 4. නැරඹීම මගින්

★ ප්‍රශ්න අංක 7 සිට ප්‍රශ්න අංක 11 දක්වා ප්‍රශ්න වලට ගැළපෙන නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියන්න

07) යම් සිදුවීමක්, යම් දෙයක් අපුරු වූ ආකාරයට මවා ගැනීම ..... ලෙස හඳුන්වයි.

08) මිනිස් ජීවිතය යහමඟට යොමු කරවන උපදෙස් ..... ග්‍රන්ථයේ ඇතුළත් වේ.

09) ..... අධි මානුෂීය චරිතයක් ලෙස හැඳින්විය හැකිය.

10) ..... රංග අභ්‍යාස වලට අයත් වේ.

11) නළුවා අංග චලන මාර්ගයෙන් හැඟීම් ප්‍රකාශනය ..... නමින් හැඳින්වේ.
(සිරිත් මල්දම/ ශිථීලකරණය/ ආංගික අභිනය/ දෙවියන්/ පරිකල්පනය)

★ ප්‍රශ්න අංක 12 සිට ප්‍රශ්න අංක 15 දක්වා ප්‍රශ්න වලට වඩාත් ගැළපෙන පිළිතුර යටින් ඉරක් අදින්න.

12) "මේකනම් කකුල් හතරේ සතෙකුගේ නාඩියක් මිස මනුස්සයෙක්ගේ වෙන්න බෑ" මෙම සංවාදය ඇතුලත් ජනකතාව වන්නේ,
1. හීල් බත් දංකුඩ ය. 2. අනුන්ට කැපූ වලේ තමන් වැටීම ය.
3. නාඬි බැලීම ය. 4. බුදුන් වඳින ලෙස වැදපන් අම්මාට ය.

13) සෝමලතා සුබසිංහ මහත්මිය විසින් රචනා කරන ලද ළමා නාට්‍යයකි.
1. අමර ගියා දිව්‍ය ලෝකේ 2. පුංචි අපට දැන් නේරෙයි
3. වලහා හා මාෂා 4. සෙල්ලං ලෙල්ලං

14) පෙර සූදානමකින් තොරව ලිඛිත පිටපතක් රහිතව සිදුකරන නිරූපණය,
1. ක්ෂණික නිරූපණය නම් වේ.
2. අභිරූපණය නම් වේ.
3. රූපණය නම් වේ.
4. අනුරූපණය නම් වේ.

15) පහත සඳහන් නිර්මාණ අතරින් ළමා නාට්‍යය නිර්මාණයක් නොවන්නේ,
1. ටිකිරි මැණිකේ.
2. අමර ගියා දිව්‍ය ලෝකේ.
3. තොප්පි වෙළෙන්දා.
4. කදා වළලු.

★ ප්‍රශ්න අංක 16 සිට ප්‍රශ්න අංක 20 දක්වා ප්‍රකාශ හරිනම් (✔) ද වැරදි නම් (X) ලකුණ ද වරහන තුළ යොදන්න.

16) භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයේ සඳහන් පරිදි අභිනය සතරකි. ( )

17) නාට්‍යයක් රඟ දක්වන ඕනෑම ස්ථානයක් රංග භූමියක් ලෙස හඳුන්වයි. ( )

18) නාට්‍ය යනු අසා රස විඳිය හැකි කලා මාධ්‍යයකි. ( )

19) රංග වස්ත්‍රාභරණ., නළුවාගේ/ නිළියගේ බාහිර සමාරෝපණයට උපකාරී වන අනුශාංගික අංගයක් වේ. ( )

20) පාලිත ලොකුපෝතාගම මහතා ළමා නාට්‍ය නිර්මාණකරුවෙකු ලෙස හැඳින්වේ. ( )

II කොටස

★ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකක් ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

01) පහත සංවාද බණ්ඩය භාවිතයෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1 වන මීයා : අපේ අප්පෝ තෙල් තාච්චිය පෙරළුනොතිං මම ඉවරයි!

2 වන මීයා : ගින්දර අල්ලන්න එපා - අපේ අම්මා මට කිව්වා !

3 වන මීයා : කැවුම් කන්න පණු ගායට - පුංචි උන්ට හොඳ නැහැල්ලූ !

i) ඉහත සංවාදය අයත් නාට්‍ය නිර්මාණය කුමක් ද? (ලකුණු 02)
ii) එම නාට්‍ය නිර්මාණයේ අධ්‍යක්ෂක නම් කරන්න. (ලකුණු 02)
iii) එම අධ්‍යක්ෂකගේ වෙනත් නාට්‍ය නිර්මාණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)
iv) මෙම සංවාදය අයත් නාට්‍ය නිර්මාණයේ වෙනත් චරිත 02 ක් නම් කරන්න. (ලකුණු 02)
v) මෙම නාට්‍ය නිර්මාණය තුළින් පුංචි අපට ලබාදෙන ආදර්ශ 02 ක් සඳහන් කරන්න. (ලකුණු 02)

02) i) රජ චරිතයකට ගැළපෙන රංගාභරණ 04 ක් නම් කරන්න. (ලකුණු 02)
ii) රංගාභරණ නිර්මාණයේ දී සැලකිලිමත් විය යුතු කරුණු 03 ක් ලියන්න. (ලකුණු 03)
iii) ඉහත (i) හි ඔබ නම් කරන ලද රංගාභරණයක් ඇඳ පෙන්වන්න. (ලකුණු 05)

03) අභිනය, නාට්‍යකදී අත්‍යවශ්‍යම අංගයකි.
i) අභිනය ප්‍රභේද කීයද? (ලකුණු 02)
ii) එම අභින ප්‍රභේද නම් කරන්න. (ලකුණු 03)
ii) ඔබ නම් කළ ඉන් එක් අභිනයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

04) නළුවෙකු තම රංගන හැකියාව වැඩි දියුණු කරගැනීමට රංග අභ්‍යාස වල නිරත වීම සිදු කළ යුතුය.
i) පංතියේ දී ඔබ ඉගෙන ගන්නා ලද රංග අභ්‍යාස 02 ක් ලියන්න. (ලකුණු 02)
ii) හඬ පාලනය සඳහා නළුවෙකු සිදු කළයුතු රංග අභ්‍යාසයක් නම් කරන්න. (ලකුණු 03)
ii) පංතියේ දී ඔබ විසින් සිදුකරන ලද රංග අභ්‍යාසයක් පියවර සහිතව ලියා දක්වන්න. (ලකුණු 05)

05) i) ඔබ පංතිකාමරයේ දී නිර්මාණය කරන ලද වෙස් මුහුණු සැදීම සඳහා යොදාගත් අමුද්‍රව්‍ය 02 ක් ලියන්න. (ලකුණු 02)
ii) රංගනයේ දී වෙස් මුහුණු පැළඳීමේ ඇති ප්‍රයෝජන 03 ක් ලියන්න. (ලකුණු 03)
iii) පංති කාමරයේ දී ඔබ විසින් නිර්මාණය කල වෙස් මුහුණක් ඇඳ, එය නිර්මාණය කළ ආකාරය පියවර වශයෙන් ලියන්න. (ලකුණු 05)